**නුවරඑළිය ප්‍රාදේශීය සභාව - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතී,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6.1 (අ)ඡේදයේ නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව පැවති දුරකථන ගාස්තු රු.22,000 ක් නිවැරදිව ණයහිමි ගිණුමට බැර කර තිබුණද, ආදාළ වැය ශීර්ෂයට රු.97,000 ක් ලෙස රු.75,000 ක් වැඩියෙන් හර කර තිබුණි. | අතපසු වීමකින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී සංශෝධිත ශේෂ පිරික්සුමට අනුව ආරම්භක ශේෂ ගැලපීම සිදු නොවී ඇති බව දන්වමි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |
| (ආ) | ජ'නල් සටහන් අංක 20 මඟින් වර්ෂයේ ගබඩා ද්‍රව්‍ය නිකුත් කිරීම් රු.1,066,694 ක් සැපයුම් සහ උපකරණ (103) වැය ගිණුම හර කර අදාළ තොග ගිණුම් බැරකළ ලෙස සටහන් තබා තිබුණද, වැය ගිණුමට රු.409,858 කින් පමණක් හර කර අදාළ තොග ගිණුම් රු.1,066,694 කින් බැර කර තිබුණි. ඒ අනුව වර්ෂයේ වියදම රු. 656,836 ක් අඩුවෙන් දැක්වෙන අතර ගිණුම් තුලනය වූ ආකාරයද පැහැදිලි නොකෙරුණි. | අතපසු වීමකින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී සංශෝධිත ශේෂ පිරික්සුමට අනුව ආරම්භක ශේෂ ගැලපීම සිදු නොවී ඇති බව දන්වමි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |
| (ඇ) | තැන්පතු ගිණුමට බැරකළ යුතු මුද්දර බදු රු.188,469 ක් සහ ජාතිය ගොඩනැගීමේ බදු රු.120,454 ක් වෙනත් ආදායම් යටතේ ආදායම් වියදම් ගිණුමට බැර කර තිබුණි. | අතපසු වීමකින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී සංශෝධිත ශේෂ පිරික්සුමට අනුව ආරම්භක ශේෂ ගැලපීම සිදු නොවී ඇති බව දන්වමි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඉකුත් වර්ෂයේ ජ'නල් සටහන් අංක 32 අනුව වර්ෂයට අදාළ වෙළඳ බලපත්‍ර ගාස්තු ආදායම රු.4,701,936 ක් වන අතර ජ'නල් සටහන් 02 අනුව වර්ෂය තුළ අයවීම් රු.4,566,736 ක් වන බැවින් වර්ෂය අවසානයට රු.135,200 ක හිඟයක් පැවතියද එම හිඟය ගිණුම්ගත කර නොතිබුණි. | අතපසු වීමකින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී සංශෝධිත ශේෂ පිරික්සුමට අනුව ආරම්භක ශේෂ ගැලපීම සිදු නොවී ඇති බව දන්වමි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 10 කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා අනුරූපී වාර්තා අනුව ශේෂය අතර රු.4,849,263 ක වෙනසක් විය. | සංශෝධිත ශේෂ පිරික්සුමක් ඔස්සේ නිවැරදි කිරීමට කටයුතු කරමි. | නොසැසඳීම් හඳුනාගෙන ගිණුම්වලට අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතු වීම. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැති වීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 5 ට අදාළව එකතුව රු.118,701,720 ක් වූ ගිණුම් ශේෂ 05 ක් ඔප්පු, පිඹුරුපත් හා ශේෂ උපලේඛන නොතිබීම හේතුවෙන් විගණනයේදී සත්‍යතාක්ෂණය කළ නොහැකි විය | විගණනයට ඉදිරිපත් නොකිරීම අතපසුවීමකින් සිදු වූවකි. | විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති , රෙගුලාසි **හා කළමනාකරණ** වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ | | | |
| 2016 මාර්තු 17 දිනැති අංක 2016/03 දරන චක්‍රලේඛයේ 04 ඡේදය | පුර නැගුම ගොඩනැගිල්ලේ කඩ කාමර බදු දීමේදී තක්සේරුකරුවකුගේ තක්සේරුවක් නොගෙන ආදායම් පරීක්ෂකගෙන් | තක්සේරු වාර්තාවක් ලබා ගැනිම ප්‍රමාද වන බැවින් සභාවේ ආදායම් නිලධාරීන් මඟින් තාවකාලික | චක්‍රලේඛ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | |
|---|---|
| ලබාගත් කඩ කාමරයකට මාසිකව රු.60,000 ක සිට රු.300,000 ක් දක්වා පරාසයක විහිදෙන කඩ කාමර 05 ක අවම තක්සේරුව මත ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් සීමිත ප්‍රසම්පාදන කැඳවීම් කර තිබුණි. | තක්සේරුවක් ලබාගෙන ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

-------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.5,919,490 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව පසුගිය වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,804,200 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීම රු.9,723,689 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

------------------------

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-----------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වරිපනම් බදු අයකර ගැනීමේදී රු.1,523,823 ක් වූ 2020 ජනවාරි 01 දිනට හිඟ ශේෂයක් විය. 2020 වර්ෂයේ බිල්කළ රු.2,184,265 ක් වූ අතර, රු.1,744,624 ක හිඟයක් විය.<br>වර්ෂාරම්භක රු.1,071,482 ක් හා වර්ෂය තුළ බිල්කළ රු.1,514,674 ක ජල ගාස්තුවලින් අයකර තිබුණේ රු.1,433,112 ක් පමණක් වූයෙන් වර්ෂ අවසානයේ හිඟය රු.1,153,044 ක් ලෙස වර්ධනය වී තිබුණි. | රට තුළ පැවති වසංගත තත්ත්වය මත සභාව මඟින් තාවකාලිකව නවතාලීමට කටයුතු කළ අතර බදු මුදල් ගෙවීම සඳහා ද සහන කාලයක් ලබාදීමට කටයුතු කිරීම නිසා ඇති වූවකි. | හිඟ කුලී නොපමාව අය කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නානුඔය පුර නැගුම ගොඩනැගිල්ලේ කඩ කාමර වෙනුවෙන් ප්‍රසම්පාදන කැඳවීම 2021 ජනවාරි 29 සිට පෙබරවාරි 12 දක්වා සිදු කළද, පුද්ගලයින් දෙදෙනකුගෙන් 2020 දෙසැම්බර් 17 දින රු.1,500,000 ක් හා 2020 දෙසැම්බර් 30 දින රු.806,400 ක මුදලක් සභාවට ලබාගෙන 2021 ජනවාරි 11 දින ගිවිසුම් අත්සන් කර කඩ කාමර සන්තකය පවරා තිබුණි. | 2020 දෙසැම්බර් 03 මහ සභා තීරණ 05.01.03 අනුව සභාව විසින් යෝජනා කර නම් කරන ලද පුද්ගලයන් පස් දෙනකු සඳහා පුරනැගුම ගොඩනැගිල්ලේ කඩ කාමර බදු ලබාදීමට සභාව ඒකමතිකව තීරණය කර ඇත. | විවෘත ප්‍රසම්පාදන කැඳවා විනිවිදභාවයකින් කඩ බදු දීමට කටයුතු කළ යුතු වීම. |

## 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 හා 2017 මාර්තු 15 දිනැති අතිරේක 33 අනුව තරඟකාරී අයදුම්පත් ප්‍රමාණයක් ලැබී නොමැති අවස්ථාවක ටෙන්ඩර් අවලංගු කර නැවත ප්‍රසම්පාදන කැඳවීමට ක්‍රියාකළ යුතු වුවද, පුර නැගුම කඩ කාමර බදුදීමේදී කඩ කාමර 05 ක් සඳහා එක් කඩ කාමරයක් සඳහා එක් ලංසුවක් පමණක් ඉදිරිපත් කර තිබියදී, කිසිදු සංසන්දනය කිරීමකින් තොරව ඉල්ලුම්කරුවන් වෙත කඩ කාමර බදු ලබාදීමට 2021 පෙබරවාරි 12 දින ටෙන්ඩර් මණ්ඩලය විසින් තීරණය කර තිබුණි. | ඉදිරියේදී එම අඩුපාඩු මඟ හරවා ගැනීමට ක්‍රියාකරන බවත්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුවම මිල ගණන් විමසීම් සිදු කරන බව දන්වා ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ නියමයන්ට අනුව කටයුතු කළ යුතු වීම. |

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සිරිසමන්ගම ජල මූලාශ්‍රයේ ආරක්ෂිත වැට ඉදිකිරීම | | |
| ඇස්තමේන්තුව හා බිල්පතට අනුව වැටෙහි උස 2.25 m වියයුතු වුවද වැටෙහි උස 1.8 m පමණක් විය. වැට කනු සඳහා 6 mm කම්බි 4 ක් යොදා ඉහළ කෙළවර 100 x 100 mm සහ පහළ කෙළවර 150 x150 mm වන කොන්ක්‍රීට් කනු භාවිතා කළ යුතු වුවද ඒ සඳහා ඉහළ කෙළවර 75 x75 mm සහ පතුල කෙළවර 120 x120 mm වන කොන්ක්‍රීට් | විමසුමේ පෙන්වා දුන් අඩුපාඩු නැවත සකස් කරන ලෙස කොන්ත්‍රාත්කාර ග්‍රාම සංවර්ධන සමිතියට දන්වා ඇත. | ඇස්තමේන්තු ප්‍රකාරව කර්මාන්ත නිම කළ යුතු වීම. |

කනු භාවිතා කර තිබුණි. කර්මාන්තය කිසිසේත් ඇස්තමේන්තු ප්‍රකාරව ඉටු නොකර තිබියදී කාර්මික නිළධාරී නිර්දේශයෙන් සභා ලේකම්ගේ අනුමැතියෙන් රු.200,000 ක් ගෙවීම්කර තිබුණි.

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**
**---------------------------------------**

**පාරිසරික ගැටලු**
**-----------------**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කඳපොළ ආයුර්වේද මධ්‍යස්ථානය පිහිටි ගොඩනැගිල්ලට යාබදව පවත්වාගෙන යන කෘෂි රසායනික ද්‍රව්‍ය අලෙවි මධ්‍යස්ථානයේ අලෙවි කිරීම සඳහා වරින් වර රැස්කර තබන සත්ත්ව පොහොර වලින් අවට දැඩි දුර්ගන්ධයක් පවතින බවට වාර්තාවේ. ආයුර්වේද මධ්‍යස්ථානයට පැමිණෙන රෝගීන්ට, ආයුර්වේද බෙහෙත් ද්‍රව්‍යවලට හා ප්‍රදේශයේ අවට ජනතාවට සෞඛ්‍ය තර්ජනයක්ව පවතින අවිධිමත් සත්ත්ව පෙහොර රැස්කර තැබීම සම්බන්ධයෙන් වරින්වර සභාව දැනුවත්කර ඇතත් සභාව කිසිදු මැදිහත් වීමක් සිදුකර නොතිබුණි. | ලබාදුන් උපදෙස් අනුව කටයුතු නොකරන්නේ නම් ඉදිරියේ දී මෙම ව්‍යාපාර ස්ථානයට විරුද්ධව නීතිමය කටයුතු කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | නොපමාව ගැටළුවට නිසි පිළියම් යෙදිය යුතු වීම. |
| (ආ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම සඳහා සභාව විසින් ඉඩමක්ද මිලදී ගෙන තිබුණද විධිමත් සැලැස්මක් සකස් කර මේ දක්වා එම ඉඩමේ කිසිදු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් සභාවේ විෂයයක් හෝ විෂයභාර නිලධාරීයෙකු හෝ නොසිටි අතර සභාව වෙත රැස්වන කුණු වෙනත් පළාත් පාලන ආයතනයන් වෙත බැහැර කිරීම සිදුකර තිබුණි. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ඉඩම පවරා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා මුදල් ගෙවා ඇති අතර මේ වන තෙක් අදාළ ඉඩම සභාවට පැවරීමක් සිදු නොකර ඇති බැවින් ඉදිරි කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇති බව දන්වා ඇත. | විධිමත් සැලැසුමකට අනුව කටයුතු කළ යුතු වීම. |